**සජිත් ප්‍රේමදාස (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**சஜித் பிரேமதாச (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கை பாராளுமன்றம்

**Sajith Premadasa (M.P.)**
Leader of the Opposition - Parliament of Sri Lanka

## අධිරාජ්‍යවාදීන් පවා හිස නැමූ දළදා හාමුදුරුවන්ටත් බිල් ලියන ආණ්ඩුවක්..!

එතෙර මෙතෙර බෞද්ධයින්ගේ මුදුන් මල්කඩවන් ශ්‍රී දළදා මාලිගාවේ ඓතිහාසික දළදා පෙරහැරට පෙර කිසිකලෙක නොවූ විරූ පරිදි විදුලි බිල්පතක් ලියා ආණ්ඩුව ස්වකීය අශිෂ්ට, අමනෝඥ පිලිවෙත හෙළිදරව් කොට ඇති අතර මේ පහත් ක්‍රියාව සම්බුදු දහමටත්, මුළුමහත් බෞද්ධ සමාජයටත්, පොදුවේ මුළු මහත් රටටත් කරන ලද නිගාවක් වන අතර, විශේෂයෙන්ම ඓතිහාසික ශ්‍රී දළදා පෙරහැර පිළිබඳව අවධානය යොමු කරන ලෝකවාසී ප්‍රජාවටත් සිදුකරන ලද බරපතළ අවමානයක් සේ සලකමි.

එය අප තුළ අති මහත් කම්පනයක් ඇති කළ බව සිහිපත් කරන අතර මේ අත්තනෝමතික තීන්දුව ගත් ආණ්ඩුවට අපගේ කොන්දේසි විරහිත පිළිකුල පලකරමි.

විශේෂයෙන්ම ජනරජ පෙරහැර වැනි කටයුතු උදෙසා ආණ්ඩුව පැකිලීමකින් තොරව මුදල් වෙන් කළ බව මේ මොහොතේ සිහිපත් කළ යුතු අතර, දෙස් විදෙස් කීර්තියක් උසුලන දළදා පෙරහැරට ආණ්ඩුව විසින් කරනු ලබන සැලකිල්ලෙහි තරම පිළිබඳව අප තුළ ඇත්තේ බලවත් පිළිකුලකි.

මීට පෙරද විහාරස්ථාන කිහිපයක් ඉලක්ක කර ගනිමින් දරාගත නොහැකි විදුලි බිලක් ආණ්ඩුව විසින් යොමු කොට තිබූ අතර මෙය බලවත් අප්‍රසාදය ගෙනදෙන කටයුත්තකි.

ඕනෑම රටකට අනන්‍ය වූ සංස්කෘතියක් ආගමික හර පද්ධතීන් ප්‍රමාණයක් ඇති බව පාලකයින් අවබෝධකොට ගත යුතු අතර ආගමික සහ සංස්කෘතික කාරණා අරභයා ආණ්ඩුවට ඇති අරියාදු කුමක්දැයි රටට හෙළිදරව් කළ යුතුය.

විහාරස්ථාන සහ ආගමික සිද්ධස්ථාන උදෙසා සහනදායි විදුලි බිලක් වෙත යොමුවීම ආණ්ඩුව නොවළහා කළ යුතු අතර ඒ උදෙසා සංස්කෘතික අරමුදලේ දායකත්වය ලබා ගැනීම ද කළ හැකිය. එය එසේ නොකොට, දරාගත නොහැකි බරක් ආගමික සිද්ධස්ථාන වෙත පැටවීම පිළිබඳව අපගේ බලවත් පිළිකුල සහ අසතුට මෙන්ම විරෝධය ද පළකර සිටිමු.

**සජිත් ප්‍රේමදාස**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක

දුරකතන : / தொலைபேசி : / Telephone : 011 2 777 253, 011 2 699 171
ෆැක්ස් : / தொலைநகல் : / Fax : 011 2 699 174
විද්‍යුත් තැපෑල : / மின்னஞ்சல் : / Email : sajith_p@dialogsl.net

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7
இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7
No 30, Sir Marcus Fernando Mawatha Colombo 7